PR/2021/ S 44

ජපන් ජනතාවගෙනි
ஜப்பானிய மக்களிடமிருந்து
From the People of Japan

# ජපන් තානාපති කාර්යාලය


4 වන මහල, M2M වැරන්ඩා කාර්යාලය, නො. 34, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,

කොළඹ 02, ශ්‍රී ලංකාව

දුරකථනය (94-11-2693831~3, ෆැක්ස්(+94-11-2698629)

ඊමේල්: cultujpn@co.mofa.go.jp


**පුවත්පත් නිවේදනය**

2021 දෙසැම්බර් මස 21 වන දින

**කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි කොට්ඨාශයේ නැවත පදිංචි කරවනු ලැබූ දරුවන්ට ජපානයෙන් සහයෝගය**

ජපන් රජයේ බිම් මට්ටමේ මානව ආරක්ෂණ ව්‍යාපෘතිය (GGP) සඳහා වන ආධාර ප්‍රදානය හරහා ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ නැවත පදිංචි වූ ළමුන් සඳහා පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන්, ඇමරිකානු ඩොලර් 88,819 ක (දළ වශයෙන් රුපියල් මිලියන 17.6 ක) ආධාර මුදලක් ලබා දීමට තීරණය කර ඇත. මෙම ආධාර ගිවිසුමට 2021 දෙසැම්බර් මස 21 වන දින කොළඹ පිහිටි ජපන් තානාපති නිල නිවසේදී ජපන් තානාපති ගරු මිසුකොෂි හිදයකි මැතිතුමා සහ මානුෂීය සංවර්ධන සංවිධානයේ (HDO) වැඩසටහන් අධ්‍යක්ෂ ජේසුරාසා අමිර්තරාජ් මහතා අත්සන් තැබීය.

මානුෂීය සංවර්ධන සංවිධානය (HDO) උතුරු පළාතේ පුනුරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, කරච්චි කොට්ඨාශයේ, ස්කන්ධපුරම් නො. 02 ජී. ටී. එම් පාසලේ, පාසල් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීම තුළින් දරුවන්ට ප්‍රමාණවත් සහ සුවපහසු අධ්‍යාපනික පරිසරයක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ වන විට 1 ශ්‍රේණියේ සිට 11 වසර දක්වා සිසුන් 248 දෙනෙකු පාසලේ ඉගනුම ලබන නමුත් පන්ති කාමර හිගය හේතුවෙන් පිටත පන්ති කිහිපයක් පවත්වාගෙන යනු ලැබේ. මෙම නව ගොඩනැගිලි මගින් ආරක්ෂිත පන්ති කාමර සහ නැවත පැමිණෙන ළමුන් සඳහා පුස්ථකාලයක් ලබා දෙන අතර විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඒකකය සඳහා පාසලට වෙනම පන්ති කාමරයක් ස්ථාපිත කිරීමට හැකියාව ලැබේ.

මෙම ආධාර මුදල පිළිබඳව අදහස් දක්වමින් අමිර්තරාජ් මහතා ප්‍රකාශ කර සිටියේ;

“මෙම පාසැල පිහිටා තිබෙන්නේ කිළිනොච්චි දිස්ත්‍රික්කයේ යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශයකයි. 2009 වසරේ ජනතාව අවතැන් වූ අතර ඔවුන් යුද්ධයෙන් පසුව නැවත පැමිණීමට පටන් ගත්තා. මෙම පාසලේ බොහෝ දක්ෂ සිසුන් ඉන්නවා කෙසේ වෙතත් දැනට පන්ති කාමර නොමැතිකම නිසා සමහර සිසුන්ට ගස් යට ඉගනීම හැර වෙනත් විකල්පයන් නැත. මෙහි වැසි සහිත හෝ දැඩි අව්ව සහිත දිනවල පන්ති පැවැත්වීම ඉතා අපහසුය. යුද්ධයේ බලපෑම නිසා ඇතිවූ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් එනම් ඕටිසම් වැනි තත්ව ඇතැවූවන් මෙම ගමට ආපසු පැමිණියා. ඔවුන් සඳහා විශේෂිත පන්ති  කාමරයක් අවශ්‍ය වන අතර එය මෙම ව්‍යාපෘතිය මගින් ලබාදෙනු ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය හරහා පාසලට පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩිකර පන්තා කාමර හිගය නිසා බඳවා ගැනීමට නොහැකිව සිටින දරුවන් රැසකට අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලබා දීමට අපට හැකි වෙනව. ස්කන්ධපුරම් නො 02 ජී.ටී.එම් පාසලේ සිසුන් සහ කාර්යමණ්ඩලය මෙන්ම අවට ගම්වාසීන්, ආදී සිසුන් සහ සුභ පතන්නන් මෙම ව්‍යාපෘතිය පිළිබඳ ඉමහත් සතුටට පත්වන අතර ජපන් රජය GGP හරහා අප ප්‍රදේශයට ලබාදෙන මෙම අනුග්‍රහය සහ පාසල වැඩිදියුණු කිරීම පිළිබඳව අවංකවම ස්තූතිවන්ත වෙනවා.”

වැඩි විස්තර සඳහා කරුණාකර අමතන්න
ජපන් තානාපති කාර්යාලයේ සංවර්ධන සහයෝගිතා අංශය
දුරකථන අංක 011-2693831 දිගුව 225
ඊමේල් : odajpn@co.mofa.go.jp